# සවියෙන් පෙරට අපි එකට
# e – ඉගෙනුම් පාසල
# හොරණ අධ්‍යාපන කලාපය

## 11 ශ්‍රේණිය බුද්ධ ධර්මය

## පළමු වාරය

## 02 පාඩම

## බුදුගුණ අනන්තය



සැකසුම:- ගංගොඩඅරාවේ සුමනජෝති හිමි

බප/හො/ රාජකීය ජාතික පාසල

# බුදුරජාණන් වහන්සේ තුළ පැවති උත්තරීතර ගුණ කිහිපයක්

- ගිලණුන්ට උපස්ථාන කිරීම
- අසරණ සරණ ගුණය
- පුරුෂදම්ම සාරථී ගුණය
- තාදි ගුණය

# ගිලණුන්ට උපස්ථාන කිරීම

- ගිලනෙකු යනු
  - කායික හා මානසික රෝගාබාධ වැලදීම හෙවත් ව්‍යාධි දුක සසර සැරිසරන සියල්ලන්ටම අත්විඳීමට සිදු වන අතර එසේ රෝගි වූ තැනැත්තා ගිලනෙකු ලෙස හැදින්වේ



# බුදුරජාණන් වහන්සේ ගිලණුන්ට උපස්ථාන කළ අවස්ථා

- වණ වූ සිරුැක් ඇතිව සිටි පූතිගත්තතිස්ස තෙරුැන්ගේ තුවාල සොදා පිරිසිදු කිරීමෙන් කායික සුවය ද අනතුරුැව ධර්ම දේශනා කිරීමෙන් මානසික සුවය ඇති කිරීම
- දරුැණු උදරාබාධයකින් පෙළමින් මළ මුත්‍ර ගොඩෙහිම වැතිර සිදු භික්ෂූන් වහන්සේ නමකට ආනන්ද හිමියන්ගේ සහයෝගය ඇතිව උපස්ථාන කිරිම
- මහාකාශ්‍යප මහරහතන වහන්සේ රෝගි වූ අවස්ථාවේ බොජ්ඣංග දේශනා කිරීම
- මුගලන් හිමියන්ට කලන්දක නිවාප නම් ස්ථානයේ දී දහම් දේශනා කිරීම

# බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානය බුද්ධ පූජාවක් බවට පත් කිරීම

''මහණෙනි ඔබට දැන් මවක නැත පියෙකු නැත එහෙයින් මෙබඳු අවස්ථාවක දී රෝගී වූ එකිනෙකා ඔවුනොවුන්ට උපකාරීව සහයෝගයෙන් ක්‍රියා කළ යුතුය මගේ මේ අවවාදය පිළිපදින තැනැත්තා ගිලනුන්ට උපස්ථාන කරන්නේය ගිලනුන්ට උපස්ථාන කරන්නා මට උපස්ථාන කරන්නේය''

**''යෝ ගිලානං උපට්ඨෙය්‍යය සෝමං උපට්ඨෙය්‍යය''**

# බුදුන් වහන්සේගේ ගිලානෝපස්ථානයෙන් අපට ගතහැකි ආදර්ශ

- කුමන ආකාරයේ රෝගියෙකුට වූ වද නිරෝගී අයගේ සහය ලැබිය යුතු බව
- අප නිරෝගීව සිටින විට ඥාතීන්ට හිතවතුන්ට අසල් වැසියන්ට හඳුනන නොහඳුනන අයට වූ වද හැකි පමණකින් උපස්ථාන කළ යුතුය
- රෝගීන් කෙරෙහි අනුකම්පාවෙන් කටයුතු කළ යුතුය
- තමන්ට ශක්ති ප්‍රමාණයෙන් රෝගීන්ගේ නිරෝගී බව ඇති කරලීමට සහය විය යුතුය

# අසරණ සරණ ගුණය

- පියාගේ මරනෙණ් පසු අනේක විද දුක් විදි සෝපාක සසුන්ගත කරවා පිහිටවීම
- සැඩොල් කුලයක උපත ලැබූ සුනීත ඉන් මුදවා සසුන් ගත කිරීම
- මරණයට නියම වූ ගොවියකු බේරා ගැනීම
- දරුවන් නොසලකා හැරි පියෙකුට පිහිටවීම
- ආලවක කුමාරයා දීඝායු කුමාරයා යක්ෂයන්ගෙන් බේරා ගැනීම
- රජ්ජුමාලාවට ජීවත්වීමට ආශාව ඇති කිරීම
- ඡත්තමානවක මට්ටකුන්ඩලි පේශකාර දියනිය භාහියදාරුච්රිය යන අයට අවසන් මොහොතේ පිහිටවීම



# බුදුරජාණන් වහන්සේ තිරිසන් සතුන්ට පිළිසරණක් වූ අවස්ථා

- උදේනි රජුට විශේෂ මෙහෙයක් කළ භද්‍රවතිකා ඇතින්ට පිහිටවීම
- දරුවන් පිරිසගේ හිංසාවට ලක් වූ ගැරඩියකුට පිහිට වීම


33

# නිබද්ධ චාරිකා යනු

''විශේෂ පුද්ගලයකු හෝ පිරිසක් අරබයා පිහිටවීමට වැඩම කිරීම''

පැසුළු යම් කිසෙහි දී මහා කරුණා සමාපත්ති සුවයෙන් වැඩ සිටීමයි



# අසරණයන්ට පිහිටවීමේ ඇති වැදගත්කම

- අසරණ අයට පිහිටවීමෙන් ඔවුන්ගේ සිත් මෙන්ම අපගේ සිත් සතුටු වේ
- ඊලඟ භවය සැපවත්වීමට හේතුවන පිංකමක් වේ
- අසරණයකුට උපකාර කළ හැකිව තිබියේ දී එසේ කිරිම උතුම් මිනිස් ගුණයකි

# පුරුෂදම්මසාරථී ගුණය යනු

- මනුෂ්‍ය තිරිසන් යක්ෂ දේව බ්‍රහ්ම ආදි සියලු සත්ව සමූහයා අතරින් නොහික්මුණු පිරිස් හික්මවා ගැනීමේ හැකියාව

- ඒ සඳහා බුදුන් වහන්සේ කරුණාව මෛත්‍රිය ඉවසීම ප්‍රාඥාව යන අධ්‍යාත්මික ගුණාංග භාවිත කළහ.



# බුදුන් වහන්සේගේ පුරුෂදම්මසාරථී ගුණයෙන් අපට ගත හැකි ආදර්ශ

- නොහික්මුණු දරදඬු සත්වයින් හික්මවා ගැනීමට දඬු මුගුරු අවි ආයුධ හෝ සැඩ පරුෂ වචන භාවිත කිරීම අනවශ්‍ය බව

- එම චරිත ලක්ෂණ ඇති පුද්ගලයන් සංවරශීලි උපක්‍රමශීලි ක්‍රමවේද මගින් සංසුන් කර හැකි බව

# තාදි ගුණය යනු

- ලාභ අලාභ
- යස අයස
- නින්දා ප්‍රසංසා
- සැප දුක ආදී වූ අටලෝ දහමින් කම්පා නොවී මධ්‍යස්ථව දරා ගැනීමේ ගුණයයි

# බුදුන් වහන්සේගේ තාදි ගුණය ප්‍රකට වන අවස්ථා

- කොසොල් රජුගේ අසදෘශ දානය හා වේරංජාවේ යව දානය පිළිගැනීම
- ජේතවනාරාමය පූර්වාරාමය වැනි සුපෝගභෝගී ආරාම මෙන්ම රුක්මුල් පර්වත සොහොන් ආදිය කටුක බිම්වල වැඩ සිටීම
- සුප්පිය නම් පරිබ්‍රාජිකයා කළ දෝෂාරෝපනය හා බ්‍රහ්මදත්ත නම් ඔහුගේ අන්තේවාසිකයා කළ ප්‍රසංසා සමසිත්න් විදදරා ගැනීම
- සුන්දරි මාගන්දියා චිංචමානවිකාව අක්කොශ භාරද්වාජ කසිභාරද්වාජ අයගේ නින්දාවන්ද පොට්ඨපාද සෝණදණ්ඩ චංකී කෝසල රජු බිම්බිසාර අනේපිඬුසිටු විශාකා උපාසිකාව වැනි අයගේ ප්‍රසංසාත් විද දරා ගැනීම

# බුදුන් වහන්සේගේ තාදි ගුණයෙන් අපට ගැනහැකි ආදර්ශ

- නින්දා ප්‍රසංසා හමුවේ නොසැලී ඉදිරියටම ගමන් කිරීමට අධිෂ්ඨාන කර ගැනීම
- ලාභ අලාභ දෙක පොදු දර්මතාවක් බැවින් එය සමසේ විද දරාගැනීමේ මානසික ශක්තිය ගොඩනගා ගැනීම
- සැප දුක දෙකේ දී නොසැලී ක්‍රියා කිරීමට හුරු පුරුදු විය යුතුය
- ජයග්‍රහනයේ දී ලැබෙන කිර්තියන් පරාජයේ දී ලැබෙන අපකීර්තියන් සම සිතින් විද ගැනීමට හුරු වීම

# ක්‍රියාකාරකම්

- බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර ගුණයන් ලියා එම ගුණයන් පැහැදිලි වෙන අවස්තා නම් කරන්න




# තෙරුවන් සරණයි